

**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.net
www.sannasa.com

**සංස්කරණය** / Editors
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක** /Asst Editor
**ක්‍රීඩා සංස්කාරක** / Sports Editor
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා** / Graphics
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ**/ Photography
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම්** / Advrertising
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
email- sjturaus@optusnet.com.au

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

වැදගත්

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කා රකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න
සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

## ලියා දන්වන වග

### තවත් මැයි දිනයක්

වැඩ කරන ජනයාගේ දිනය යයි කියන තවත් මැයි දිනයක් අවසන් විය. වැඩ කරන ජනතාවගේ දිනය වුවද එහි නොසිටියේම වැඩ කරන ජනතාවය.

මැයි දිනය ලෝකය පුරා වැඩකරන ජනයාගේ දිනය බවට පත්වන්නේ උදාර අරමුණු ඇතිවය. ලෝකවාසී කම්කරුවන් මෙදිනට රතු ධජය යටතේ එක්වන්නේ ඒ අරමුණු උදෙසා ය. සමස්ථ කම්කරුවන්ගේ අයිතිවාසිකම් උදෙසාය. කම්කරු අයිතිවාසිකම් වෙනුවෙන් පාලකයනට බලපෑම් කිරීම සඳහා ය. ඒ අරමුණු අපේ රටේ මැයි දිනයට වලංගු නැත.

අපේ රටේ අද පවත්වනු ලබන මැයි දිනය හුදෙක් එක් එක් දේශපාලන පක්ෂ සහ ව්‍යාපාර වල ප්‍රචාරක දිනයක් බවට පත්ව ඇත්තේ වැඩ කරන ජනතාවගේ වරදින්මය. සිය බලය පිළිබඳ නිසි තක්සේරුවක් හෝ අවබෝධයක් හෝ නොමැතිව සිටිනා තාක් කල් මැයි දිනය දේශපාලන පක්ෂ වල දිනයක් ලෙසම පවතිනු ඇති බව විශ්වාස ය.

එක් එක් දේශපාලන පක්ෂ වල බල අරගලය වෙනුවෙන් පෙළපාලි යනවාට වඩා සිය අයිතිවාසිකම් වෙනුවෙන් එක්සත් වීම සඳහා නුවණැස කම්කරුවන්ට ලැබේවා යි පතන්නෙමු. එය කම්කරු අයිතිවාසිකම් වෙනුවෙන් සිය ජීවිත පූජා කළ දහස්ගණනක් වන මිනිසුනට කරන උපහාරයක්ද වෙයි.



# ඉන්දු භීතිකාවෙන් ඔබ්බට

**මහාචාර්ය චන්දිම ගෝමස්**
**පුත්‍ර සරසවිය, මැලේසියාව**

නැවතත් රාවණා සුළඟක් රට හරහා හමමින් පවතී. මගේ ජීවිත කාලයේදී මේ රාවණාගේ පුනරාගමනය මම කිහිප විටක් දැක ඇත්තෙමි.

80 දශකයේ මුල් සමය ප්‍රබල ඉන්දීය විරෝධී හඬක් නැගුන අවධියකි. ලාංකික ජන විඥානයේ කොටි ත්‍රස්තවාදියා සහ ඉන්දියාව ඒකාබද්ධ කරගෙන තිබුණේ මුල් කාලයේ සිටමය. 83 වර්ෂයේ කොටි ත්‍රස්තවාදීන් ශ්‍රී ලංකා යුධ හමුදාවේ භට පිරිසක් ඝාතනය කරමින් ත්‍රස් තවාදය එළිපිට කරලියට ගෙන ඒමට වසර දෙක තුනකට පෙර සිටම ඉන්දියාව දෙසින් යම් යම් අරියාදු ඇතිවන්න විය. ඒ සමඟම රාවණා රජු පිළිබඳව ගුවන් විදුලි කතන්දර, පුවත්පත් ලිපි, චිත්‍රකතා වැලක් පැමිණියේය.

අසූව දශකයේ අග භාගයේ ඉන්දියාවෙන් පරිප්පු දැමීමත්, ඉන්දු - ලංකා සාම ගිවිසුම අත්සන් කිරීමත් සමග නැවතත් රාවණා මතුවිය. එම ගිවිසුම ලංකාව මත ඉන්දියාව විසින් බලහත්කාරයෙන් පැටවූ ලියවිල්ලක් බව ඒ කාලයේ බොහෝ ලාංකිකයන්ගේ අදහස විය. එහි ප්‍රතිඵලය වුයේ දැඩි ඉන්දීය විරෝධයක් ජනතාව අතරින් මතුවීමයි.

මෑතකදී ඉන්දියාව විසින් ජාත්‍යන්තරයේදී ලංකාවට එරෙහිව හඬ නැගීමත් සමඟම නැවතත් රාවණා අවදි විය. මෙවර ඉන්දීය බලපෑම වඩාත් තීව්‍ර වූ අතර ඊට අනුලෝමව රාවණා පිළිබඳ ජන විඥානික වපසරියද විශාල වන්න විය. පසුගිය වසර කිහිපයේදී ඉන්දියාවෙන් දිගින් දිගටම සිදු වූ අයහපත් බලපෑම් හමුවේ රාවණාටද වැඩි වැඩියෙන් ජීවය ලැබෙන්න විය.

සුද්දාගෙන් මදී නොකියන්න බැටකමින් සිටි විසිවන සියවසේ මුල් භාගයේ ලාංකිකයා ලදියසේනල නමින් කුමාරයෙක් බිහිව තමා බේරාගන්න තෙක් බලා සිටියේද මේ ආකාරයෙන්මය.

මා මේ සංසිද්ධිය දෙස බලන්නේ හිතට නැගෙන තදබල ආත්ම අනුකම්පාවකිනි. ලෝක ඉතිහාසය පුරාම අසල ඇති ප්‍රබල රාජ්‍යයන්ගේ අරියාදු වලට දුර්වල අසල්වාසීන් ලක්විය. මෙහිදී රටේ විශාලත්වයට වඩා බලපෑවේ ප්‍රබල රාජ්‍යයේ සමෘද්ධිමත් භාවයයි. උදාහරණයක් ලෙස

12 වන පිටට